# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල (නව නිර්දේශය)**

**අභිලේඛන, සංස්කෘතිය හා ජනශ්‍රැතිය SINH – E3025**

පළමුවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් එක් ප්‍රශ්නයක් ද දෙවන හා තෙවන කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

## 1 කොටස

01. පහත සඳහන් ශිලා ලේඛන පාඨවල අදහස ලිහිල් බසින් ලියන්න.

අ) උපශික - මහනගය කධිතය උපශික - රොණිය ශගශ
ගමණි - අබයශ කඩයය අබි - කණිය ලෙණෙ ශගශ
මනපෙ (දසනෙ)
මහරකඩහ ගමණි - තිශශ බරිය උපශික කිතකය ලෙණෙ ශගශ
කොඩතිශෙන - තෙරශ අතිවශික බත - සුමන දත තෙරශ ලෙණෙ ශගශ (ලකුණු 08 යි)

ආ) සි පුවිය මහසෙන මහරජහ පුත සිරිමෙකවණ අබ
මහරජහ චත ලෙගි
තක තිණවනක වසහි නකරහි උතරපසහි කළහුමනක
නියමතනහි සිය අ-
-විය කිණියෙනි නිකත කඩුබලගමකෙහි වසනක අමෙති
පහෙජ සිවය-
- හ පුත දෙවයහ යහිසපවය නවවහෙරකෙහි දින අරියව
- ස වටවි, දෙහකඩ දස අමණක වී ඉව ස අමණක
උදි ඉව බයලි දස අමණ ඉව මෙදෙහකඩ දස අ-
-මණක වි පිටදඩහසහි වෙඩ අකලහසහි වෙඩ ම-
-දෙහසහි වෙඩ පචවිසිය අමණක වි ඉව (ලකුණු 08 යි)

ඇ) ඇතිනකර මඟුල්
මහවෙයැ දකුණ්දොර් අසන්හි රජ්වෙද්හල්
කරය් රොව්බියසමය් පොදොනවුලු පුලුඩාවුලුයෙන් කෙත්කම්
සුලබ් කොට් සිරිලක් ළොහුරුවය් සාබිය නි
වය් රට්සොයය් සැත්බිය නෙර නන්ජැයින් නන්සෙය්
බුද්බන්ද්කරය් සියල් ඉසිරුයෙන් පූජය් දා සැණෙ
න් බුද්රුවන් අරියය් ධමුරුවන් කවරි සෙයෙකින් පුජනෙම්
හො යන අදහස් පුරය් අභිධම්දෙසුන් කසුන්
පත් අරවය් මහපුජා කොට් සසුන් සිට්වම් යන සිත්දොල්නෙන්
ඇජර පය හමුයෙහි එ මෙ ධම් දෙසුන් වියක්
හත් කළ සියබස්නෙන් බුද්ගුණ වැනූ රිවි අන්වයෙන් බට්
සැහැකුලකොත් ඔකාරජ්කුලට් තලාටික් අප පුරුමු
වො තුමන් සත් ලැගු සවන හවුරුදුයෙහි අබහය්ගිරි වෙහෙර
කපාරාමුළට් සලමෙය්වන් පව් කරය් සඟුන්
වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබිදි අවසට්
මෙ සිරිත් තැබැවුහු// අබහය්ගිරි වෙහෙර්හි
ඉසා සෙය්ගිරිවෙහෙර්හි ඉසා බද්තුවාක් ඇත්වෙහෙර
ගම්බිමට් ඉසා මෙහි මෙ අබැදි තුවක් වෙහෙර්හි ඉසා (ලකුණු 08 යි)

ඇ)　සිරිබර කැත් කු-
ල කොත් උකාවස්
රද් පරපුරෙන් බ-
-ට් ලක්දිව් පොළො
යොන පරපුරෙන් හි
-මි වූ එ මෙ කුලෙන් බ
-ට් සමුදගොන් බිසො
රදුනයැ උපැදූ ඈපා ම
-හයා සිරි විදූ පිළිවෙළ
සෙ රදූ පැමිණැ රදූ ක
-ළ සිරිසගබො උදා ම
-හරදහු තුමා සත් ලැ
-ගු දෙවන හවුරුදු
-යෙහි නිකිත්නි ස (ඳ්)
අව විසෙනියි සොර
බරහි ආවූ හොපිටි
ගමුපදියැ වැපාර(ය)
-න් කුඩින් වත්හිමිය (න්)
වහන්සෙ මියගුණුමහ
වෙර වැඩි කලැ ගි-
-ය දවසැ පදිලද් ද-
-ඩනායකයන් ගැත්ත
-න් සතළොසැ පිරිනිවි
යන්වහන්සෙ දවසැ
කළ වැවස්ථා ඉක්මැ............　(ලකුණු 08 යි)

නැතහොත්



02. 'බ්‍රාහ්මී අක්ෂරවල සම්භවය ක්‍රි.පූ. 03 වන සියවසේ සිද්ධ වූවක් නොවේ.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. ලක්දිව අතීත සමාජ තොරතුරු අධ්‍යයනයක දී අභිලේඛනවලින් ලැබෙන පිටිවහල කෙබඳුදැ යි නිදසුන් සහිතව විභාග කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතරින් එකක් පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයන්න.

අ) තෝණිගල ගිරිලිපිය
ආ) බදුලු ටැම් ලිපිය
ඇ) V වන කාශ්‍යපගේ අනුරාධපුර පුවරු ලිපිය
ඈ) වේවැල්කැටිය පුවරු ලිපිය

## II කොටස

05. භෞතික හා අභෞතික සංස්කෘතිය අතර පවතින සමවාය සබඳතාව කෙරෙහි විශේෂාවධානයෙන් සංස්කෘතිය සංකල්පය පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. ''සිංහල සංස්කෘතියෙහි ශ්‍රේෂ්ඨතම අංගය ලෙස සැලකිය යුත්තේ වැව් ය.'' මේ විචාරක මතයෙහි යුක්ති යුක්තතාව පරීක්ෂා කරන්න.

07. යුරෝපා ජාතීන්ගේ පාලන සමයෙහි මෙරට සංස්කෘතියෙහි ඇති වූ විපර්යාස අභිමත එක් යුරෝපා ජාතික ආක්‍රමණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

## III කොටස

08. ජනශ්‍රැතිය යන්න නිර්වචනාශ්‍රයෙන් පැහැදිලි කර ඊට අයත් ප්‍රමුඛාංග පිළිබඳ විශ්ලේෂණයක් කරන්න.

09. ''ජනශ්‍රැතියෙහි අන්තර්ගත වන්නේ මිනිසාගේ සාමූහික චින්තනයේ නියෝජනය යි.'' විමසන්න.

10. ''සතුන් කෙරෙහි වූ කෘතවේදී ආකල්ප මෙන් ම බියමුසු ගෞරවය ද සත්වශ්‍රැති නිර්මාණය වීමෙහි ලා පාදක විය.'' සනිදර්ශනාත්මකව පරීක්ෂා කරන්න.

නැතහොත්

සිංහල ජන ජීවිතය හා තුරුලතා අතර පවත්නා සබඳතාවන්හි විවිධ ස්වරූප වෘක්ෂශ්‍රැතීන්හි කවරාකාරයෙන් සටහන් වී ඇත්දැයි නිදසුන් සහිතව පරීක්ෂා කරන්න.

(02 වන පිළිතුරේ සිට 10 වන පිළිතුර දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 17 බැගිනි.)

*********************************